

# කස්තිරම

ඩී බී කුරුප්පු

## කතුවරුන් දෙදෙනකුගේ උපදෙස්

**නිවැරදි** ඉංගිරිසි ලියන්නට පුරුදු වනු වස් ''ඩේලි නිව්ස්'' පත්තරයේ කතුවැකිය කියවන්නැයි අපට ගුරුවරුන් උපදෙස් දුන් කාලයක් විය. ඒ දැනට වසර පනහකට විතර ඉස්සරය. දැනුත් ඒ විදියට උපදෙසක් දෙනවාදැයි නොදනිමි. හොඳ සිංහල ලිවීමට පුරුදු වනු වස් සිංහල පත්තරවල කතුවැකි කියවන්නට උපදෙස් නොදෙන බව නම් සිතිය හැකිය. සුවිශේෂ රචනා ශෛලියක් සතු කතුවරුන්ගේ යුගය ගෙවී ගොස් ඇති නිසා විය යුතුය.

මේ ටික සඳහන් කළේ වත්මන් පුවත්පත් කතුවරුන් හැල්ලු කරන්නට නොවේ. මට ඉඳහිට කියවන්නට ලැබෙන පුවත්පත් අනුව හිතට කා වැදුණු මගේ අදහස සපුරා නිවැරදි නොවන්නට ද පිළිවන.
ඉදිරියට තවත් සියවස් කෙසේ වෙතත් දශක කිහිපයක්වත් අමතක නොවන බව කිව හැකි පුවත්පත් කතුවරුන් දෙදෙනකු ලියූ කතුවැකි ඇතුළත් පොත් දෙකක් පසුගිය වසර තුළ අප මව්බිමේ ප්‍රකාශයට පත්විය. එකක් මත භේදයට තුඩු දුන් අදහස් පළ කළද විසිවැනි සියවසේ බිහිවූ මහා සිංහල පඬිවරයා යයි කටපුරා කිව හැකි කුමාරතුංග මුනිදාස ලියූ ලක් මිහිණි පහන් කතුවැකි එකතුවයි. එය බොරලැස්ගමුවේ විසිදුනු ප්‍රකාශකයන් විසින් නිකුත් කරන ලද්දකි.

කොග්ගල ධර්මතිලක පඬිතුමන් විසින් 1862 සැප්තැම්බර් මස 11 වැනි දින ''ලක් මිණි පහණ'' යන නමින් අරඹන ලදුව පසුව අභාවයට ගිය පළමු සිංහල පුවත්පත කුමාරතුංග මුනිදාස විසින් ''ලක්මිණි පහන්'' යන නව නමින් නැවත අරඹනු ලැබුවේ 1934 ජුනි 26 වැනිදාය. එදින සිට 1935 දෙසැම්බර් මස 03 වැනි දින දක්වා ඔහු විසින් ලියන ලද කතුවැකි මෙම එකතුවට ඇතුළත් කොට ඇත. දෙවැනි පොත ''සිරා ලියූ කතුවැකිය'' ගුණසිරි සිල්වා විසින් සංස්කරණය කරන ලද මෙම එකතුව 2006 නොවැම්බර් මුලදී උත්සවාකාරයෙන් එළිදක්වන ලදී. සිරා නමින් දන්නා නොදන්නා හැමදෙනාම හැඳින් වූ බී.ඒ. සිරිවර්ධනයන්ගේ කතුවැකි පළවූයේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයක් වූ ''ඇත්ත'' පත්තරයේය. සිරාගේ කතුවැකිවල වටිනාකම තවත් වැඩි වන්නේ සංස්කාරක ගුණසිරි සිල්වා සඳහන් කොට ඇති පරිදි, ඔහු පක්ෂයේ සුවච කීකරු ගෝලයකු ලෙස කටයුතු නොකොට බොහෝ අවස්ථාවලදී පක්ෂයේ දුර්මතවලට පයින් ගසන්නට වුව එඩිතර වූ නිසා ය.
''සිරා ලියූ කතුවැකි'' දොරට වැඩීමේ උළෙලේ දී කතා කළ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම සිරාගේ ''පුවත්පත් කලා ජීවිතය වත්මන් මාධ්‍යවේදී සියලුදෙනාම ආදර්ශයට ගත යුතු යයි'' ප්‍රකාශ කළේය. ඇමතිතුමා ඇත්තටම අදහස් කළේ සිරාගේ දිවිය නොව, පුවත්පත් කලාවේදී පළ කළ දස්කම් හා එඩිය ආදර්ශයට ගත යුතු බවය. ඇමැතිතුමා කී පහත දැක්වෙන වදන් බෙහෙවින් වැදගත් යයි සිතමි.

''වර්තමානයේ ඇතැම් මාධ්‍ය සිංහලත් නොවන ඉංග්‍රීසිත් නොවන භාෂාවක් යොදා ගනිමින් කරන කටයුතු හා යෙදුම් දෙස බලන විට දී සිරිවර්ධන වැනි පුවත්පත් කලාවේදීන්ගේ අගය වඩාත් ප්‍රබල ලෙස දැනෙන්නේය.''

මෙම ලිපියෙන් මා අදහස් කරන්නේ යට කී අගනා කතුවරුන් දෙදෙනා සිය කතුවැකි ඔස්සේ භාෂාව ගැන බස් වහර ගැන පළ කළ අදහස් කිහිපයක් උපුටා දැක්වීමටය.

බස ගැන - වියරණය ගැන - කුමාරතුංගවන් තරම් අවධානයක් - සැලකිල්ලක් යොමු කළ තවත් ලේඛකයකු නැති තරම් ය. 1934 ජුලි මස 17 වැනි දින ලියූ කතුවැකියෙන් ඒ බව මෙසේ තහවුරු කොට ඇත. නීති රීති නැත භාෂාව දැනුණු මිනිසුනට නොසෑහෙනුයේ.

''නින්දිත සිරිත් ඇත්තවුන් හා සමග හැසිරීමෙන් තමන්ගේ සිරිත් ද ක්‍රමයෙන් නින්දිත බවට පෙරැළීමට ඉඩ ඇත්තා සේ මැ අශිෂ්ට භාෂා ව්‍යවහාරය කරන්නවුන් සමග හැසිරීමෙන් කලෙක දී ශිෂ්ටයන්ගේ භාෂාවද අශිෂ්ඨ අතට පෙරැලෙන්නට ඉඩ ඇති හෙයිනි''

1934 නොවැම්බර් 13 වැනි දින කතුවැකියක් උපුටා ගත් පහත දැක්වෙන වදන් ඊටත් වඩා හැඟීම්බරය.
''යුතුකම දන්නා පිය තෙමෝ, තමාගේ දරුවා ඉතා මහත් ප්‍රේමයෙන් ඉතා මහත් සැලකිල්ලෙන් වඩයි. දරුවගේ ඇඟ ඇඳුම් කිලිටි වැ තිබෙන්නට ඉඩ නොදෙයි. ''මේ අසුවලාගේ දරුවා නොවැ?'' අනේ ඔහුගේ මුහුණේ කැත. අනේ ඔහුගේ ඇඳුමේ කිලුටු පාට'' යනාදිය කියමින් රටුන් තමා ගරහන බව සිතියි දැයි පියා දනියි. සිහිය ඇති රචකයාද සිය ලිපිය දරුවා මෙන් පවත්වයි. එපමණක් කීම ප්‍රමාණවත් නොවේද?''
සිරාගේ අදහස් මෙන්ම බසද අරිට වඩා සරලය. පහතින් උපුටා දක්වන්නේ ''නිවැරදි සිංහල'' ය යන හිසින් ඔහු ලියා 1960 ජනවාරි 23 වැනි දින කතුවැකියෙනි.

''භාෂාව අදහස් පැවසීමේ මාධ්‍යයයි. එකකුගේ අදහස් අනෙකාට නිරවුල්ව පැවැසීමට නම් දෙදෙනාටමමම තේරෙන සම්මතයක් පිළිවෙතක් බසෙහි තිබිය යුතුයි. සමාජයේ නිරවුල් පැවැත්මට විනයක් නීතියක් තිබිය යුතුවා සේම බසේ නිරවුල් වහරට ද විනයක් නීතියක් තිබිය යුතුය. එයට වියරණය යැයි කියනු ලැබේ.

සිංහල වැනි ජීවමාන බසක තව විශේෂ ලක්ෂණයක් ඇත. එනම් එය නිරන්තරයෙන් වැඩෙන්නක් වීමයි. දිනපතාම බසට අළුත් වචන, අළුත් යෙදුම් එක් වෙයි. විවිධ භාෂා කතා කරන මිනිසුන් අතරේ අන්‍යෝන්‍ය සම්බන්ධය අද මෙන් දියුණු වී ඇති යුගයක බොහෝ විට මේ අලුත් වචන අළුත් යෙදුම් පිට භාෂාවලින් බිඳ ගනු ලැබෙයි. එහි වරදක් නැත.

කෙසේ හෝ වේවා බසකට විශේෂ වූ වියරණයත්, බසෙහි නිරන්තර වැඩීමත් අතරේ පරස්පර විරෝධතාවක් ඇතැයි අපට නම් නොපෙනේ. බොහෝ පණ්ඩිතයින් පොදු වරද්දා ගෙන ඇත්තේ මේ දෙක පරස්පර විරෝධී සේ සලකන නිසා යැයි අපි සිතමු.

යම් බසකට අළුතින් එක් වන වචන, යෙදුම්, ප්‍රයෝග යන සියල්ල ඒ බසේ විශේෂ රටාවට අනුකූලව හැඩ ගැසිය යුතුය. කොයි භාෂාවේ සැටිත් එසේ ය. එසේ නොවුවහොත් අළුතින් එක් වන අංග එක් රටාවක් අනුව හොඳට වියු රෙද්දක තැනින් තැන අල්ලන ලද අණ්ඩ මෙන් සිටිනු ඇත.
අද අප ඉදිරියේ ඇති විද්‍යාත්මක අදහස් පැවසීමට පැරැණි සිංහලයේ බස ප්‍රමාණවත් නොවේ නම් එක්කෝ වෙන බසකින් ණයට ගත යුතුය. නැතිනම් අළුතින් වචන සාදා ගත යුතුය. එහෙත්, එසේ කිරීමේදී අළුතින් එන වචන සිංහල භාෂා රෙද්දට ඇල්ලූ අණ්ඩ නොවන්නට වග බලා ගත යුතුයි. සම්මතයක් අවශ්‍ය වන්නේ මේ සඳහාය. ඒ කාරිය බොරුවට ඉඳිමෙන්නට දඟලන කොල්ලන්ට, කුරුට්ටන්ට නොව, බස ගැනත් එක් එක් පක්ෂය ගැනත් දැනුමක් ඇති පිරුණු මිනිසුන් හට බාර දිය යුතුයි.''




**ආදරණීය නේරංජනා**

ඔබෙ මුදු මදහස් රැළි මාලාවේ
වෙලී බැඳුණා දින රඟ ශාලාවේ
තුන් සිතකින්වත් නොසිතූ විලසින්
යළි ඔබ දැකුමට ආ වේලාවේ
අපි හමු වූ ගෙවුයන් සීමාවේ
එක මොහොතක් පමණකි තනි වුයේ
මටමම පුදුමයි අදහන්නට බෑ
මම ම නොවේ යළි ඉන් පිටවූයේ

කවුදෝ මා පසු පස එනු දැනුණා
පාළු වීදියේ තනිකම මැකුණා
ජීවමාන කිසිවෙකු සිටියේ නෑ
එනමුදු කවුදෝ ඇති බව හැඟුණා
නිදියහනේ මා නින්දට වැටුණා
ඔබ මා සිහිනෙන් අමතනු පෙනුණා
එනමුදු කෙළෙසද ඇගෙ අත ගන්නේ
මගේ සිතම මට මුමුණනු ඇසුණා.




සිසිර දිසානායක

**මෙල්බර්න්** නුවර සමාධි බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අරමුදලට ආධාර පිණිස පසුගියදා ''රටකින් එහා'' නමින් ප්‍රසංගයක් පැවැත්වුණා. ප්‍රසංගයේ නම කී පමණින්ම සිහියට එන්නේ ගීතයක්. ගීතයේ පළවෙනි පද දෙකින්ම එය ගායනා කරන ගායන ශිල්පියාගේ නමත් එක්ක හඬ සිහියට එනවා. ඒ ප්‍රවීණ ගායන ශිල්පී ප්‍රියා සූරියසේන. හැත්තෑව දශකයේ මුල් භාගයේ ඉඳන්මම ආදරයෙන් තමන්ව වට කරගත් රසිකයින් සූරියසේන ශිල්පියාණන්ව හැඳින්වූයේ ''ප්‍රියා'' නමින්. ඒ කාටත් ඔහුගේ කටහඬ, ගීත පමණක් නොවෙයි ගතිගුණ අතිනුත් ප්‍රියයෙකු වූ නිසා වෙන්නට ඇති. සන්දර්ශනයට පසුවදා උදේ වරුව 'ගී සඳළුව' වෙනුවෙන් ප්‍රියා සමඟ ගත කරන්නට ''සන්නස'' වරම් ලැබුවා.
''මේ ගීතය කෙරුණ 1971 දී විතර'' ප්‍රියා තමන්ගේ හඬ අවදි කළා. ඉතාම විශාල ස්වර පරාසයක විහිදුවා ගයන්නට පුළුවන් මිහිරි, තීව්‍ර හඬක්, ඒ කට හඬ.
''අපි ගියා වැල්ලවත්තේ මුදේ නාන්න''
''අපි කිව්වේ?''
''මායි, ප්‍රේමකීර්තියි'' ප්‍රේමකීර්ති ද අල්විස් නිබන්ධකයාණන් පිළිබඳ වූ අටුවා ටීකා අවශ්‍ය නොවේවි.
''වික්ටර්ට එයාගේ මොකක්දෝ වැඩක් තියෙනවා කියලා ඉක්මණින්ම ගොඩවෙලා ගියා.. අපි දෙන්නත් වතුරෙන් ගොඩට ඇවිත් ඇඟපත පිහිදා ගෙන එහෙම ගියා බම්බලපිටියේ තිබුණ ආපන ශාලාවකට.''
''අපි සින්දුවක් හදමුද?'' ප්‍රේම් හිටි ගමන්



ඇහුවා. ''බලමු, මමත් හෙමිහිට තාලයක් මුමුණන්න ගත්තා. මම කියන කියන තාලයට දැන් ප්‍රේම් ලියනවා. විනාඩි දහයකින් වගේ සින්දුව සම්පූර්ණයි.

''වැඩේ ලස්සනට ආවා..... අපි දැන්මම යමු පටිගත කරන්න.'' ප්‍රේම් කිව්වා. ''ඇත්ත තමයි කතාව යමු.'' අපි සත තිහේ ටිකට් දෙකත් අරගෙන 104 බස් එකට නැංගේ ගුවන් විදුලියට යන්න. එතකොටයි මතක් වුණේ අද සෙනසුරාදා නේද කියලා. ''කමක් නෑ යමු. ගිහින් බලමු.'' මමත් ''හා''කිව්වා.'' ප්‍රියා ඒ සොඳුරු මොහොත සිහිපත් කරන්නේ කියන්නට නොහැකි තරම් සතුටකින්.

''ඉතින් ගුවන් විදුලියට ගිහින් බලන කොට වාදකයෝ නෑ. ''හාෆ් ඩේ'' දවසක් නේ. ටිකක් කැරකිලා බලන කොට ''ගෝචුන්ස්'' වාදක මණ්ඩලයේ සැක්සෆෝන් එක වාදනය කරපු රන්ජිත් පෙරේරා මුණ ගැහුණා. ''රංජිත් අයියා මෙන්න මේකට මොනවා හරි මියුසික් එකක් දානා දෙන්න පුළුවන්ද?'' බලාගෙන ගියාම රංජිත් අයියාට හැම දෙයක්ම වාගේ වාදනය කරන්න පුළුවන්. අපි දැනගෙන ඒ බවක් උන්නෙ නෑ. ඒත් ඒ වෙලාවේ තිබුණේ බොක්ස් ගිටාර් එකක් විතරයි. ''ඒ විතරක් යැ? කවුද සින්දුව රෙකෝඩ් කරන්නේ.'' හොඳ වෙලාවට යූ. ආරියවිමල් මුලිච්චි වුණා. දන්නවානෙ උන්නැහේ ගැන?''

යූ. ආරියවිමල් ඉතාම දක්ෂ ශබ්ද පටිගත කිරීමේ ඉන්ජිනේරුවෙක්. එකල ගුවන් විදුලි සංස්ථාවේ සිදු කෙරුණ බොහෝ පටිගත කිරීම්වල සාර්ථකත්වයට හේතුව ආරියවිමල් ශිල්පියාණන්ගේ දායකත්වයයි.
''අනේ ඉතින් ආරියවිමල් උනන්දු වෙලා මැදිරියත් ඇරලා ''ස්පූල් ටේප්'' එකකට පටිගත කරන්න සූදානම් කරලා දුන්නා. පද යෙදුවා වගේම තාලය කියන කොට රංජිත් අයියා සංගීතය හදා ගත්තා. විනාඩි දහයකින් විතර අපි මේ ගීතය පටියට ගත්තේ එකමමම එක ''බොක්ස් ගිටාර්'' එකක් එක්කයි. පස්සෙ කාලයක තැටියට ඇවිත් රසිකයෝ අතරට ගියාට පස්සේ හරි ජනප්‍රිය වුණ ගීතයක් ''ආදරණීය නේරංජනා.'' අදටත් රසිකයො ඉල්ලනවා මමත් ඉතින් ගායනා කරනවා. ලංකාවේ දෙවෙනියට කළ කැසට් එක මගේ එකක්. ඒකට මේ ගීතය ඇතුළත් වුණා. විජය රාමනායක තමයි ඒ කැසට් පටිය කළේ. '

'දන්නවාද තවත් කාරණයක්?'' ප්‍රියා කතාව නිමා කරමින් ඇහුවා. ''ප්‍රේම් මේ ගීය ලියලා තියෙන්නේ හොල්මනක් ගැන.'' පද ටික පරිසසමට කියවලා බලන්නකෝ...''

ප්‍රියා සමඟ කාලය ගත කරන්නට අවසරය ලබා දුන්න සරත් බණ්ඩාර සොහොයුරාවත්, සම්බන්ධීකරණය කළ නන්දන ඇතුලත්මුදලි සහ රුව සිතඳවම් කිරීමට අවශ්‍ය සේයා රූ සහ ගී තැටි සැපයූ ලලිත් අරුණ ශාන්. යන අපේ ගායන ශිල්පීන්වත් ''සන්නස'' සිහිපත් කරන්නේ ස්තූති පූර්වකව.